2025. 12. 31

# මාධ්‍ය නිවේදනය

## ජනමාධ්‍ය නියාමනය සඳහා වන ස්වාධීන කොමිසමක් වහා ස්ථාපිත කිරීම ක්ෂේත්‍රයට අදාළ ගැටලු රැසකට විසඳුමයි - නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ වෘත්තීය සමිතිය

අසත්‍ය පුවත් විකාශනය කරන ලදැයි චෝදනා එල්ල වී ඇති විද්‍යුත් මාධ්‍ය ආයතන කිහිපයක විකාශන බලපත්‍ර ආපසු කැඳවීමට ආණ්ඩුව කටයුතු කරමින් සිටින බවට හෝ එසේ කළ යුතු බවට සමාජය තුළ ගොඩනැගී ඇති කතිකාව සම්බන්ධයෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ මෙන්ම එහි වෘත්තීය සමිතියේද දැඩි අවධානය යොමුව තිබේ.

ප්‍රස්තුත සිදුවීම්වලට අදාළව අදහස් ප්‍රකාශ කරමින්, එය ජාතික ආරක්ෂාවට බලපාන කාරණයක් නම් ඒ සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට පසුබට නොවන බවට විෂය භාර අමාත්‍යවරයාද පවසා තිබේ.

සියලු විද්‍යුත් මාධ්‍ය වෙත ලබාදී ඇති සංඛ්‍යාත මහජනයා සතු දෙපලක් බවද, ඊට අදාළව ජනමාධ්‍ය සමාජ වගකීමෙන් බැඳෙන බවද මේ පසුබිමෙහි වටහා ගත යුතු නමුත් භාෂණයේ සහ ප්‍රකාශනයේ ව්‍යවස්ථාපිත නිදහස ඊට අදාළ සීමාවන් තුළ ආරක්ෂා වීම කෙරෙහිද සමස්ත සමාජයේ අවධානය යොමු විය යුතුය. මාධ්‍ය නිදහස යනු එකී සකලවිධ කාරණා අතර සමබර හා විනිවිද පෙනෙන සුළු වූවකි.

එබැවින් මාධ්‍ය නිදහස පිළිබඳ සංකල්පය අවභාවිතා කරමින් මහජනයා වෙත අසත්‍ය ප්‍රචාර කිරීම තුළින් සමාජ අගතීන් නිර්මාණය කිරීමද පිළිගත නොහැකි තත්ත්වයකි. එබැවින්, එවැනි ක්‍රියා නියාමනය කිරීම අත්‍යාවශ්‍ය කටයුත්තක් වේ.

එසේම බහුතර විද්‍යුත් මාධ්‍ය ආයතන වෙත ලබාදී ඇති බලපත්‍ර දේශපාලන වුවමනාවන් ඉටු කරගැනීමට ලබා දුන් ඒවා බවටද සමාජය තුළ මතයක් පවතී. කිසිදු ආකාරයක විනිවිද පෙනෙන වැඩපිළිවෙලකින් තොරව ලබා ගත් එම සංඛ්‍යාත ප්‍රයෝජනයට ගනිමින් විකාශන පවත්වා ගෙන යනු ලබන ඇතැම් විද්‍යුත් මාධ්‍ය ආයතනවල සේවය කරනු ලබන ජනමාධ්‍යකරුවන්ගේ අයිතිවාසිකම්ද ඒවායේ හිමිකරුවන් විසින් අමු අමුවේ උල්ලංඝණය කරමින් සිටින බව අමිහිරි සත්‍යයකි. එවැනි ඇතැම් ආයතනවල හිමිකරුවන් කම්කරු අයිතිවාසිකම්ද නොසළකා කටයුතු කරන බව නිරීක්ෂණය වේ.

මෙම තත්ත්වය විද්‍යුත් මාධ්‍යවලට පමණක් සීමා නොවන අතර පුද්ගලික මුද්‍රිත මාධ්‍ය ආයතන තුළ තත්ත්වයද වෘත්තීය අයිතීන් නොසළකා කටයුතු කිරීම දක්වා වර්ධනය වී ඇත. මාසයක් පුරා දිවා රාත්‍රී නොබලා තම රාජකාරිය අකුරට ඉටුකරන වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ වැටුප පවා නියමිත වේලාවට නොලැබෙන අතර, එය මාස 3-4 ක් ප්‍රමාද කරන තත්ත්වයක් දක්නට ඇත. EPF/ETF ඇතුළු ඔවුන්ට හිමි සියලු වරප්‍රසාද අහිමි කර ඇත. ඒවා පිළිබඳව ප්‍රශ්ණ කළ විට සේවයෙන් ඉවත්ව යන ලෙස තර්ජනය කළ අවස්ථා බොහෝමයක් අප වෙත වාර්තා වී තිබේ.

**Free Media Movement Trade Union (FMMTU)**
**Secretary**: Lasantha De Silva +94 71 166 7938 | **President**: Dileesha Abesundara +94 77 299 2597
**Treasurer**: Ananda Jayasekara +94 77 312 4850 | **Assistant Secretary**: R. Ramkumar +94 77 381 1033
No 96, Bernard Soysa Mw, Colombo 05. **Tel**: +94 112 36 8895, **Fax**: +94 112 36 8895;

**Email**: fmmtusrilanka@gmail.com|**Facebook:** https://www.facebook.com/fmmtu.srilanka
**Twitter**: https://twitter.com/fmmtusrilanka

ප්‍රාදේශීය මට්ටමින් කටයුතු කරන මාණ්ඩලික හා  ප්‍රාදේශිය ජනමාධ්‍යකරුවන්ගේ තත්ත්වයද ඉතාම ශෝචනීය වේ. ඔවුන්ට හිමි, නියමිත වැටුප හා ගෙවීම් මාස ගණන් ප්‍රමාද වෙමින් තිබේ. ඇතැම් ආයතන ජනමාධ්‍යකරුවකුට හිමි සේවා හැඳුනුම්පත හෝ ලබාදීමට කටයුතු කර නොමැත.

මෙවැනි ගැටලු රාශියක් ජනමාධ්‍ය කර්මාන්තයට අදාළව අද වනවිට දක්නට ලැබේ. ඒවා  විසඳා ගැනීම සඳහා ආණ්ඩුව අනුගමනය කළ යුතු මාර්ගය වන්නේ සියලු පාර්ශවයන්ගෙන් සැදුම්ලත් ස්වාධීන, මාධ්‍ය නියාමන කොමිසමක් ස්ථාපිත කිරීමට පහසුකම් සැපයීමයි.

ආණ්ඩු විසින් මාධ්‍ය නියාමනය කරනු ලැබීමට මැදිහත් වීම නූතනවාදී  ප්‍රවේශයක් නොවන හා ප්‍රජාතන්ත්‍රවාදය පටහැණි පසුබිමක වර්තමාන ආණ්ඩුවේ කාර්යභාරය වන්නේ ඒ සඳහා අවශ්‍ය පරිසරය  නිර්මාණය කිරීම සඳහා කටයුතු කිරීමයි.

ඒ සඳහා වර්තමාන ආණ්ඩුවට අවශ්‍ය  මඟ පෙන්වීමක් ඇත්නම්  නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ වෘත්තීය සමිතිය හා මව් සංවිධානය වන නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද සහාය ලබාදීමට සූදානම්ය. එසේම ස්වාධීන මාධ්‍ය නියාමන කොමිසමක් ස්ථාපිත කිරීම සඳහා මෙම ආණ්ඩුව අවංක උත්සාහයක යෙදෙන්නේ නම්  ඒ සඳහා ජනමාධ්‍ය ප්‍රජාව දායකත්වය ලබාදෙන බවද අපගේ විශ්වාසයි.





**දිලිෂා අබේසුන්දර**
**සභාපති**

**සුජීව සෙනරත්**
**උප සභාපති**

**නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ වෘත්තීය සමිතිය**

**Free Media Movement Trade Union (FMMTU)**
**Secretary**: Lasantha De Silva +94 71 166 7938 | **President**: Dileesha Abesundara +94 77 299 2597
**Treasurer**: Ananda Jayasekara +94 77 312 4850 | **Assistant Secretary**: R. Ramkumar +94 77 381 1033
No 96, Bernard Soysa Mw, Colombo 05. **Tel**: +94 112 36 8895, **Fax**: +94 112 36 8895;

**Email**: fmmtusrilanka@gmail.com|**Facebook:** https://www.facebook.com/fmmtu.srilanka
**Twitter**: https://twitter.com/fmmtusrilanka